මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date. 2024.10.22

ඒ.එම්.එස්.කුමාර
අංක 119,
ශාස්ත්‍රවේල්ලිය,
කැකිරාව.

**පැමිණිලිකාර පාර්ශවය**

01. ටී.එම්.ඩබ්ලිව්.එන්.තෙන්නකෝන්
පොලිස් පරීක්ෂක ( විශ්‍රාමික ),
අංක 294, වෙරුන්කුලම පාර,
කැකිරාව.

02. ප්‍රසන්න වැලිකල
ප්‍රධාන පොලිස් පරීක්ෂක,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, කැකිරාව.

**වගඋත්තරකාර පාර්ශවය**

**පැමිණිලි අංකය : HRC/ANU/60/2023(S)**

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**

පැමිණිලිකරු විසින් 2023.01.30 දිනැති පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, 2018.10.18 වන දින සිදුවූ රිය අනතුරකට අදාලව තමා සම්බන්ධ නඩුවක් අංක 39547 යටතේ කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණයේ පවත්වාගෙන යනු ලබන බවයි. එසේම, එකී අංක 39547 දරණ රථ වාහන නඩුවේ ඉදිරි නඩු දිනය තමා නොදන්නා බැවින් ඉදිරි නඩු දිනය පිළිබඳව කිහිප අවස්ථාවකදී කැකිරාව පොලිස් ස්ථානය වෙත ගොස් කරුණු විමසුවද කිසිදු තොරතුරක් තමා වෙත පොලිස් නිලධාරීන් විසින් ලබා නොදුන් බව ද පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

කරුණු මෙසේ තිබියදී 2023.01.18 වන දින මෙම නඩුව කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණයේ කැඳවා තිබූ බවත්, තමා ඒ පිළිබඳව දැනුවත්ව නොසිටි බවත්, අංක 39547 දරණ නඩුව 2023.01.18 වන දින අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී මෙම නඩුවේ අනෙක් පාර්ශවය වන ජී.ගයාන් උදාර ලක්ප්‍රිය යන අය සඳහා වරෙන්තුවක් අධිකරණය මගින් නිකුත් කර ඇති බවත්, අදාල වරෙන්තුව තමාට එරෙහිව ඇති



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

බව පවසා තමාව කැකිරාව පොලිස් ස්ථානය වෙත කැඳවා 2023.01.19 වන දින ප.ව. 3.00ට පමණ කැකිරාව පොලිස් ස්ථානයේදී තමාව අත්අඩංගුවට ගත් බවත් පැමිණිලිකරු විසින් දන්වා ඇත.

තවද, 2023.01.19 වන දින ප.ව.3.00ට සිට 2023.01.20 වන දින පෙ.ව. 9.00 දක්වා තමා පොලිස් සිර මැදිරියේ රඳවා සිටින ලද බවත්, අනතුරුව කැකිරාව පොලිස් ස්ථානයේ රථවාහන අංශයේ පොලිස් පරික්ෂක විසින් තමා සිර මැදිරියෙන් එළියට ගෙන තමාගෙන් ප්‍රකාශයක් ලබා ගෙන "වැරදීමක් වුණේ සමාවෙන්න" යැයි පවසා තමාව පොලිස් නිලධාරියෙකු සමඟ තම රැකියාව කරන ස්ථානය වෙත ඇරලවන ලද බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.
එසේ හෙයින්, පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් ඉල්ලා සිටින්නේ, සාධාරණ හේතුවක් නොමැතිව තමාව අත්අඩංගුවට ගැනීම තුලින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බැවින් තමාට සාධාරණය ඉටුකර දෙන ලෙසයි.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දැක්වීමට අවස්ථාව ලබාදුන් විට අංක 965/23 සහ 2023.03.14 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් 2 වන වගඋත්තරකරු වන කැකිරාව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති දන්වා ඇත්තේ, පැමිණිලිකරු වන ඒ.එම්.එස්.කුමාර යන අයව සැකපිට අත්අඩංගුවට ගනු ලැබූ බවයි. එමෙන්ම, මෙම අයව සැකපිට පරික්ෂා කිරීම සඳහා 2023.01.19 වන දින පැය 23.45ට අත්අඩංගුවට ගත් බවද කියා සිටියි.

2023.01.19 වන දින පැය 23.45ට අත්අඩංගුවට ගත් පැමිණිලිකරු 2023.01.20 වන දින පැය 7.00ට පොලිස් ඇප මත මුදාහරින ලද බවත්, මෙම පැමිණිලිකරුට වරෙන්තුවක් ඇති බවට ඇති වූ සාධාරණ සැකය මත සැකපිට අත්අඩංගුවට ගත් බවත්, වරෙන්තුවක් ඇති බවට හෝ වෙනත් වරදක් සම්බන්ධයෙන් හෝ කරුණු අනාවරණය නොවූ බැවින්, පොලිස් ඇප මත මුදාහරින ලද බවත්, ඒ.ආර්.559/2023 යටතේ මේ පිළිබඳව අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බවත් 2 වන වගඋත්තරකරු වන කැකිරාව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් සිය වාර්තාව තුළ දක්වා ඇත.

<u>නිරීක්ෂණ</u>

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කොට සිටින්නේ, කැකිරාව පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරියෙකු විසින් සිතාසියක් භාරදීමට ඇති බව දුරකථනය මගින් තමා වෙත දන්වා එම සිතාසිය අත්සන් කර භාර ගැනීම සඳහා කැකිරාව පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙස දන්වන ලද බවත්, ඒ අනුව 2023.01.19 වන දින කැකිරාව පොලිස් ස්ථානය වෙත ගිය පසු තමාව අත්අඩංගුවට ගෙන සිර මැදිරිය තුළට දමා තමාට අගතියක් සිදුකළ බවත් ය.

වගඋත්තරකාර පාර්ශවය මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරුව වරෙන්තුවක් ඇති බවට සැකපිට අත්අඩංගුවට ගත් බවයි.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවය කැඳවා කොමිෂන් සභාවේදී 2023.06.23 වන දින පරීක්ෂණයක් සිදුකරනු ලැබූ අතර, එකී පරීක්ෂණයේදී පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ 2023.01.19 වන දින කැකිරාව පොලිස් බල ප්‍රදේශයේ වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මෙහෙයුමක් දියත් කළ බවත්, මෙම මෙහෙයුම සඳහා කැකිරාව පොලිස් ස්ථානයේ ඇති සියලුම අංශවලින් නිලධාරීන් සහභාගී කර ගත් බවත්, එම මෙහෙයුමේදී මෙම පැමිණිලිකරු හටද වරෙන්තුවක් නිකුත් වී ඇති බවට තොරතුරු හෙළි වූ බවත්, එම නිසා මෙම පැමිණිලිකරු කැකිරාව පොලිස් ස්ථානය ඉදිරිපිට සිටියදී සැකපිට අත්අඩංගුවට ගත් බවත් ය.

තවද, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසුව පොලිස් ස්ථානයේ පවත්වාගෙන යනු ලබන වරෙන්තු ලේඛණය පරීක්ෂා කළ බවත්, එම වරෙන්තු ලේඛණයේ මෙම පැමිණිලිකරුගේ නමට එරෙහිව වරෙන්තුවක් නිකුත් වී නොමැති බව අනාවරණය වූ බවත්, ඒ අනුව මෙම පැමිණිලිකරු 2023.01.20 වන දින පෙ.ව. 7.00ට පොලිස් ඇප මත මුදාහරින ලද බවත්, අදාල අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඒ වාර්තාවක් මගින් අධිකරණය වෙත කරුණු වාර්තා කළ බවත්, මෙම පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීම අතපසු වීමකින් සිදුවූවක් බැවින් එය වහා නිවැරදි කළ බවත් වගඋත්තරකාර පාර්ශවය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

2 වන වගඋත්තරකරු වන කැකිරාව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත එවා ඇති අංක 965/23 සහ 2023.03.14 දිනැති වාර්තාව මගින් ප්‍රකාශ කොට සිටින්නේ, මෙම පැමිණිලිකරුට වරෙන්තුවක් ඇති බවට ඇති වූ සාධාරණ සැකය මත පැමිණිලිකරුව සැකපිට අත්අඩංගුවට ගැනීම සිදුකළ බවයි.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සඳහා සම්බන්ධ වූ 1 වන වගඋත්තරකරු කියා සිටින්නේ, මෙම පැමිණිලිකරුට ද වරෙන්තුවක් නිකුත් වී ඇති බවට තොරතුරු ලද බවත්, එම නිසා මෙම පැමිණිලිකරු කැකිරාව පොලිස් ස්ථානය ඉදිරිපිටදී අත්අඩංගුවට ගත් බවත් ය.

පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් කියා සිටින්නේ, තමා රාජකාරී කරමින් සිටියදී තම දුරකථනයට පොලිස් නිලධාරියෙකු විසින් ඇමතුමක් ගෙන සිතාසියක් භාර ගැනිමට ඇති බව පවසා කැකිරාව පොලිස් ස්ථානයට එන ලෙස දැන්වූ බවත්, තමා පොලිස් ස්ථානය වෙත පැමිණි පසු පොලිස් ස්ථානයේදී අත්අඩංගුවට ගනු ලැබූ බවත් ය.

කැකිරාව පොලිස් ස්ථානයේ රථවාහන තොරතුරු සටහන් පොත (1) හි 2023.01.19 දින පැය 18.35ට පිටුව 400 ඡේදය 195 යටතේ ස්ථානාධිපතිවරයා විසින් ලබාදුන් නියෝගයක් අනුව වරෙන්තුකරුවන්

අත්අඩංගුවට ගැනීමට හා සැකපිට පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට විශේෂ මෙහෙයුම් රාජකාරි සඳහා 1 වන වගඋත්තරකරු වන පොලිස් පරික්ෂක තෙන්තකෝන් නිලධාරියාගේ අත්සන තබා පිටව යාමේ සටහන යොදා ඇති බව නිරීක්ෂණය වේ. රථවාහන තොරතුරු සටහන් පොත ( 2) හි 2023.01.19 දින පැය 00.05 පිටුව 38 ඡේදය 213 යටතේ පැමිණිමේ සටහන් යොදමින් අත්අඩංගුවට ගත් වරෙන්තුකරුවන්ගේ තොරතුරු සටහන් පොතේ තබා ඇති අතර, 1 වන වගඋත්තරකරු වන පොලිස් පරික්ෂක තෙන්නකෝන් විසින් පැය 23.45ට තමා විසින් කැකිරාව නගරයේදි සැකපිට අත්අඩංගුවට ගන්නා ලද අතපත්තු මුදියන්සේලාගේ සරත් කුමාර (ජාතික හැඳුනුම්පත් අංක 741550750V) ශාස්ත්‍රවේල්ලිය, කැකිරාව යන අය පිළිබඳව ලේඛණ පරික්ෂා කිරීමේදී කැකිරාව ම/උ නඩු අංක 39547 දරණ නඩුව සඳහා 2023.01.18 දින වරෙන්තු නිකුත් වී නොමැති බවටත්, සැකපිට වරද කියා දී අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් ස්ථානාධිපතිතුමාගේ උපදෙස් ලැබෙන තෙක් උප සේවක පො. සැ. 47733 ගමලත් නිලධාරියා වෙත හරියාකාරව භාරදුන් බවටත් සටහන් යොදා ඇති බව පෙනී යයි.

1 වන වගඋත්තරකරු වන පොලිස් පරික්ෂක තෙන්නකෝන් නිලධාරියාගේ ඉහත කී රථවාහන තොරතුරු සටහන් පොත ( 2) හි 2023.01.19 දින පැය 00.05 පිටුව 38 ඡේදය 213 යටතේ යොදන ලද සටහන අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන පරික්ෂා කිරිමේදී කැකිරාව ම/උ නඩු අංක 39547 සඳහා 2023.01.18 දින වරෙන්තුවක් නිකුත් වී නොමැති බවට එම අවස්ථාවේදීම අනාවරණය කරගෙන ඇති බව නිරීක්ෂණය වන අතර, එසේ අනාවරණය කර ගැනීමෙන් පසුවද පැමිණිලිකරු 2023.01.19 දින පැය 23.45 සිට 2023.01.20 දින පැය 7.00 දක්වා ඇප ලබාදෙන තෙක් සිර මැදිරියේ රඳවා තබා ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකරු වන පොලිස් පරික්ෂක තෙන්නකෝන් නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ, පැමිණිලිකරුට එරෙහිව වරෙන්තුවක් ඇති බවට වන සැකය මත ය. අධිකරණයක් විසින් වරෙන්තුවක් නිකුත් කිරීමේ දී අදාල වරෙන්තුව නිකුත් කරන පුද්ගලයාගේ නම හා ලිපිනය වරෙන්තුවේ සඳහන් කරන අතර, එම වරෙන්තුවේ නඩුවේ අංකය ද සඳහන් කරනු ලබයි. ඒ අනුව පොලීසිය වෙත ලැබෙන වරෙන්තු පිටපත් අදාල අංශයන් විසින් නිසි ආකාරයට පරික්ෂා කර බලා නඩු අංකය අනුව වරෙන්තුකරු පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගැනීමෙන් පසුව වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැටලීම් සිදුකිරීම සාමාන්‍ය රාජකාරිය වේ.

මෙම පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීමට අදාල කැකිරාව පොලිස් ස්ථානයේ සටහන් පොත් වල උධෘතයන් හා වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ සලකා බැලීමේදී කැකිරාව පොලිස් ස්ථානය වෙත ලද අංක 39547 දරණ නඩුවේ වරෙන්තු පිටපතෙහි සඳහන් වරෙන්තුකරු පිළිබඳව කිසිදු පූර්ව පරික්ෂාවක් සිදුකොට නොමැති බවත්, පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු වරෙන්තුව පරික්ෂා කර ඇති

බවත්, මෙමගින් වගඋත්තරකාර පාර්ශවය විසින් සිය රාජකාරිය නිසි වගකීමෙන් යුක්තව ඉටුකර නොමැති බවත් නිරීක්ෂණය වේ.

එසේම, මෙම පැමිණිලිකරු වරෙන්තුවට සැකපිට අත්අඩංගුවට ගත් බවද වගඋත්තරකාර පාර්ශවයේ උධෘතයන්හී සඳහන් වේ. වරෙන්තුවක් නිකුත් කිරීමේදී වරෙන්තුකරු කවුරුන්ද යන්න පිළිබඳව නිශ්චිතව දක්වා අදාළ වරෙන්තුව නිකුත් කරන බැවින් පැමිණිලිකරු සැකපිට අත්අඩංගුවට ගැනීමේ අවශ්‍යතාවයක් මතු නොවන බවද කොමිෂන් සභාවට පෙනී යයි.

1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 52(1) වගන්තිය මගින් අධිකරණය විසින් වරෙන්තුව කවරෙකු වෙත යොමු කළ යුතුද යන වගත්, 52(2) වගන්තිය මගින් වරෙන්තුව නිකුත් කරන අධිකරණය විසින් එය නමින් හෝ නිලයෙන් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් වෙත යොමුකල හැකි වගත් දක්වා තිබේ.

තවද, 53 වගන්තිය මගින් වරෙන්තුවේ සාරය දැනුම්දීම පිළිබඳව කරුණු දක්වන අතර, සිරභාරයට ගනු ලැබූ තැනැත්තා විසින් වරෙන්තුව පෙන්වන ලෙස ඉල්ලා සිටිනු ලැබුවහොත් එය සිරභාරයට ගනු ලැබූ තැනැත්තාට පෙන්විය යුතු බවද සඳහන් වේ.

මෙම පැමිණිල්ලෙහි පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී ඔහුට වරෙන්තුවක් නිකුත් වීමට හේතුවක් නොමැති බව වගඋත්තරකාර පාර්ශවය වෙත දන්වා ඇති නමුත්, වගඋත්තරකාර පාර්ශවය පැමිණිලිකරුගේ දැන්වීම නොතකා ඔහුව අත්අඩංගුවට ගෙන ඇති බව පෙනී යන බැවින් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් අසත්භාවයෙන් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද, සිරභාරයට ගනු ලැබූ තැනැත්තා ප්‍රමාදයකින් තොරව අධිකරණය වෙත ඉදිරිපත් කළයුතු බව 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 54 වගන්තිය මගින් දක්වා ඇතත්, පැමිණිලිකරුව 2023.01.19 වන දින පැය 23.45ට අත්අඩංගුවටගෙන 2023.01.20 වන දින පැය 00.05 වන විට මෙම පැමිණිලිකරුට වරෙන්තුවක් නිකුත් වී නොමැති බව 1වන වගඋත්තරකරු විසින් අනාවරණය කරගෙන තිබිය දී 2023.01.20 දින පැය 7.00ට පුද්ගලික ඇපයක් ලබාදෙන තෙක් පොලිස් ස්ථානයේ සිරමැදිරිය තුළ රඳවා ගෙන තිබේ. මේ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරුට කිසිදු චෝදනාවක් නොතිබියදී ඔහු කෙරෙහි අසද්භාවයෙන් කටයුතු කරමින් සිරභාරයේ රඳවා ගෙන සිට ඇති බව ද නිරීක්ෂණය වේ.

1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 59 වගන්තිය මගින් වරෙන්තුවක් ළඟ නොමැති වුවද සිරභාරයට ගනු ලැබිය හැකි බව දක්වා තිබේ. එකී වගන්තිය අනුව යම් තැනැත්තෙකු සිරභාරයට ගනු ලැබීම සඳහා වරෙන්තුවක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තෙකු යයි විශ්වාස කිරීමට පොලිස් නිලධාරියෙකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක, මේ පරිච්ඡේදයෙහි පටහැනිව කුමක්

සඳහන් වුවද, ඒ වරෙන්තුව ඒ අවස්ථාවේ තම සන්තකයෙහි නොමැති වුවද, ඒ වරෙන්තුව ක්‍රියාවෙහි යෙදවීමෙහිලා ඔහු විසින් ඒ තැනැත්තා සිරභාරයට ගනු ලැබිය හැකි බව සඳහන් වේ.

එහෙත් වගඋත්තරකාර පාර්ශවය වෙත මෙම පැමිණිලිකරුව වරෙන්තුවක් නිකුත් වී ඇත යන විශ්වාසය මත එම අවස්ථාවේදී වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම සඳහා සාධාරණ හේතු නොපැවති බවද ඉහතින් සාකච්ඡා කර ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුව 2023.01.19 වන දින පැය 23.45ට අත්අඩංගුවට ගෙන 2023.01.20 පැය 7.00 දක්වා රඳවා ගනු ලැබුවේ පැමිණිලිකරුට එරෙහි කිසිදු චෝදනාවක් හෝ වරෙන්තුවක් නොතිබියදී බව ඉහතින් සාකච්ඡා කර ඇති 1 වන වගඋත්තරකරුගේ අත්අඩංගුවට ගැනීමේ සටහන් අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකරුට එරෙහිව චෝදනාවක් නොමැතිව පොලිස් භාරයේ රඳවා තබා ගැනීමෙන් වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් අසද්භාවයෙන් යුතුව කටයුතු කර ඇති බව පෙනී යයි.

1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 37 වන වගන්තිය ප්‍රකාරව සිරභාරයට ගනු ලැබූ තැනැත්තෙකු පැය විසි හතරකට වැඩි කාලයක් රඳවා තබා නොගත යුතු බව දක්වා තිබේ. එහිදී අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තෙකු අවස්ථාගත සියළු කරුණු අනුව යුක්ති සහගත වන කාලයකට වඩා දීර්ඝ කාලයක් අත්අඩංගුවේ රඳවා තබා ගැනීම හෝ අන් ලෙසකින් රැඳවීම නොකළ යුතු බව සඳහන් වේ.

පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඔහුට එරෙහිව වරෙන්තුවක් නිකුත් වී නොමැති බව 1 වන වගඋත්තරකරු දැන දැනම ස්ථානාධිපතිවරයාගේ උපදෙස් ලැබෙන තෙක් රඳවා තබන බව සටහන් කොට පැමිණිලිකරුව උප සේවයට භාර දී ඇත් බැවින් පැමිණිලිකරුට එරෙහිව වරදක් හෝ වරෙන්තුවක් නොමැති බව දැන දැනම වගඋත්තරකරු විසින් අයුක්ති සහගත කාලයක් පැමිණිලිකරුව පොලීසියේ රඳවා තබා ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

එමෙන්ම, 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 36 වගන්තිය ප්‍රකාරව අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව පැමිණිලිකරුට ඇප ලබාදීමේ හැකියාව තිබුණද එම ප්‍රතිපාදනයන් ප්‍රකාරව කටයුතු කිරීමටද වගඋත්තරකාර පාර්ශවය අපොහොසත්ව ඇති බවද නිරීක්ෂණය වේ.

<u>නිගමනය</u>

පැමිණිලිකාර පාර්ශවය සහ වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට ඇති සියලු කරුණු සලකා බැලීමේදී පැමිණිලිකරුට එරෙහිව ඔහු අත්අඩංගුවට පත්වන අවස්ථාවේදී කිසිදු අධිකරණයකින් වරෙන්තුවක් නිකුත් වී නොමැති බැවින් පැමිණිලිකරුට එරෙහිව වරෙන්තුවක්

ඇති බවට සැකපිට අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාවේ සඳහන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද, මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමෙන් පසු ස්ථානාධිපතිගේ නියෝග ලැබෙනතෙක් සිරමැදිරියේ රඳවා තබනු ලැබූ බව කැකිරාව පොලිස් ස්ථානයේ පොලිස් තොරතුරු පොත් උධෘත මගින් සනාථ වන අතර, පැමිණිලිකරුට එරෙහිව වරදක් අනාවරණය වී නොමැති බවටත්, ඔහුට එරෙහිව වරෙන්තුවක් නිකුත් වී නොමැති බවටත් පැහැදිලිවම කරුණු ඉදිරිපත්ව තිබියදී ඔහු සිර මැදිරියේ රඳවා තැබීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(2) ව්‍යවස්ථාවෙහි සඳහන් අත්අඩංගුවටගෙන නීත්‍යානුකූල නොවන පරිදි රඳවා තබාගැනීමෙන් වැළකීමේ නිදහස යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවද මෙයින් නිගමනය කරනු ලැබේ.

එමෙන්ම, මෙම පැමිණිලිකරු 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 32 වගන්තිය හෝ 33 වගන්තිය ප්‍රකාරව වරදක් කර ඇති බවට කරුණු අනාවරණය වී නොතිබියදී සහ පැමිණිලිකරුට එරෙහිව වරෙන්තුවක් නිකුත්වී නොතිබියදී පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවද මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

1. 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රු.5,000/-ක මුදලක් බැගින් රු.10,000/- ක මුදලක් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

2024. නොවැ: 27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද කොමිෂන් සභාවට

දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නිතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :- 01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - කරුණු දැනගැනීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය